සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මුල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2021.07.28

සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක :- 2021/17

සියළුම සමෘද්ධි බැංකු සමිති විධායක කමිටු/ බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් ,

**<u>Covid-19 ව්‍යවසනකාරි තත්ත්වය නිසා බලපෑමට ලක් වූ පවුල්වලට රු. 5000/- දීමනාව ගෙවීම් කිරිමේ රාජකාරිවල නිරත වූ නිලධාරින්ට දින වැටුප් / ප්‍රවාහන දීමනාව ලබාදීම</u>**

01. අග්‍රාමාත්‍ය ලේකම් විසින් 2021.05.31 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක PTF/03-2021(1) දරණ චක්‍රලේඛ උපදෙස් මත covid-19 ව්‍යවසනය හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට රු. 5000/- සමාජ ප්‍රතිලාභ ගෙවීම සමෘද්ධි බැංකු හරහා ගෙවීම සිදු කරන ලදී.

02. එම රාජකාරිවල නිරත වු සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය ඇතුළු ග්‍රාම නිලධාරි වසම් (ක්ෂේත්‍රගත) වල රාජකාරිවල නිරත සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට සති අන්ත/ රජයේ නිවාඩු දිනවල රාජකාරිවල නිරතවීම වෙනුවෙන් එක් නිලධාරියෙකුට උපරිම දින 02 ක දින වැටුප් ලබාගැනීමට අනුමැතිය හිමිවේ. තව ද ක්ෂේත්‍රගත සමෘද්ධි නිලධාරින්ට රු. 1000/- ප්‍රවාහන දීමනාවක් ද ගෙවීමට කටයුතු කළ යුතුය.

03. යම් සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු ග්‍රාම නිලධාරි වසමක වැඩ බලන අවස්ථාවක සමාජ ප්‍රතිලාභ ගෙවීම වෙනුවෙන් එක් දිනක (01) දින වැටුප් ලබාගැනීම හා රු. 1000/- ප්‍රවාහන දීමනාව ලබාගැනීමට ද හිමිකම ඇත.

04. සෘජුවම ඉහත කී සමාජ ප්‍රතිලාභ ගෙවීම් රාජකාරිවල නිතර වු සමෘද්ධි බැංකු සමිති/ මුලස්ථාන කළමනාකරුවන් ඇතුළු ස්ථිර කාර්ය මණ්ඩලය සති අන්ත/ රජයේ නිවාඩු දිනවල රාජකාරි ඉටු කර ඇත්නම්, දින දෙකක (02)දින වැටුප් සමෘද්ධි බැංකු සමිති වලින් ලබාගැනීමට බලය ලබාදෙමි.

05. සමෘද්ධි බැංකු, බැංකු සමිති සහ මුලස්ථාන කළමනාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය ඉහත කී රාජකාරි කටයුතු සඳහා ග්‍රාම නිලධාරි වසම්වලට ක්ෂේත්‍ර රාජකාරිවල නියුතු වුයේ නම් පමණක්, රු. 1000/- ප්‍රවාහන දීමනාව ලබාගැනීමට ද හැක.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

06. දින වැටුප් සහ ප්‍රවාහන දීමනාව 2021 ජූනි මසට පමණක් අදාල වන අතර බැංකු/ බැංකු සමිති/ මුලස්ථානවල කාර්යාලවල නියුතු නිලධාරින් දින වැටුප්/ ප්‍රවාහන දීමනාව ඉල්ලුම් කිරිමේදී එම රාජකාරිවල නිරතවීම සහ බලය ලැබීම පිළිබඳ තහවුරු කිරිමේ සහතික ඉදිරිපත් කල යුතුය.

07. 2021.04.11 දින නිකුත් කරන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/09 මඟින්, ලබාදුන් උපදෙස් මත, රු. 5000/- සමාජ ප්‍රතිලාභ ගෙවීමේ රාජකාරිවල ග්‍රාම නිලධාරි වසම්වල වැඩ බලන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට ( දැනට ගෙවා නොමැති විටක) 2021 අප්‍රේල් මස සති අන්ත/ රජයේ නිවාඩු දින 01 ක් සඳහා දින වැටුප් ගෙවීමට බැංකු කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අදාල නිලධාරින්ට පමණක් දින 01 ක දින වැටුප් ලබාදීමට කටයුතු කරන ලෙසත් දන්වමි.

08. එක් එක් නිලධාරියාට හිමි දින වැටුප් ගණනය කිරීම සඳහා දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් තවදුරටත් වලංගු කර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්,සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස. සහ අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
6. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන් , දිස්ත්‍රික් ලේකම් කාර්යාල - අ.ක.ස.